## නත්තලයි ගවලෙනය

ආනන්ද ගුණතිලක
හොපර්ස් ක්‍රොසිං

සෑම වසරෙම දෙසැම්බරයේ - ලොවේ හැම රටකම වගේ
සාමයේ ගීතිකා සහ කවි - කැරොල් දස අත හඬ නැගේ
ජාති කුල මළ, උස් පහත්කම් - නොසලකා 'සමිඳුන්' වගේ
සාමයේ කුමරා උපන් බව - සිහි කරමු අපි එක වගේ

අසීමිත ප්‍රේමයක් හද තුල - පුරව ගෙන අපෙ පව් මකන් නට
දේශනාකර, අසල්වැසි හැම - දෙනා වෙත ආදරය දෙන් නට
පාපයෙන් මුදවලා අප හැම - ස්වර්ගයට යන මඟ කියන් නට
මනු ලොවට ආ ජේසු සමිඳුට - එකතු වෙමු අපි තුති පුදන් නට

ඉදිමු නත්තල් සීයා එනතුරු - තෑගි අරගෙන එයා එන්නේ
හදමු නත්තල් ගහක් සරසල - ඒකෙ තේරුම කව්ද දන්නේ
ජේසු බිලිඳුගෙ උපත සිහිකර - 'ගව ලෙනක්' ගැන හිතට එන්නේ
අපේ කීයෙන් කී දෙනාටද - සමිඳුනේ ඇයි මෙහෙම වෙන්නේ

පහදලා නත්තලේ තේරුම - හය හතර හරියට නො දන්නා
ළමා ලපටින් වෙත ලබා දිය - යුතුයි නිවැරදි අරුත ගෙන්නා
වැඩිමහල් අය එකට එකතුව - පොඩි අයට හරි විදිය පෙන්නා
ගව ලෙනක් අපි හදමු නිවසේ - බොරුව පසෙකට දමා පන්නා

ගව ලෙනක් ඉදිරියේ ඉඳගෙන - කවි කැරොල් ගීතිකා ගයලා
ජේසු බිළිඳුගෙ උපත සමරමු - සාමයේ හඬ මෙයයි කියලා
රජවරුන් තුන් දෙනා සිහිකොට - තෑගි අරගෙන ආපු දුවලා
නත්තලට අපි තෑගි දියයුතු - වෙන්නෙ නැති බැරි පිරිස බලලා

ජනේරුව ඊ ලඟට එනවා - අලුත් අවුරුද්දකුත් අරගෙන
ශුභ පතමු අපි හැම දෙනාටම - සතුට සම්පත ලැබෙන විලසින
ලෙඩ දුකක් හෝ කම්කටොලු නැති - සාමදනය දස'ත පැතිරෙන
පතමු හැමටම අලුත් වසරක් - හද පුරා හිනැහෙන්න හැකිවෙන

## යුද තොටෙහි රැය

මුල් ගීතය▪ මා ජින් ෂිං (චීන ජාතික)
පරිවර්තනය▪ පී.එම්.පතිරණ

යුද තොටෙහි රාත්‍රියයි
නිසසලයි නිහඬයි
රළ පෙළ වැදෙන නැවු බඳ
මුදු සර නඟා පද්දේ
යොවුන් නැවියන්ගේ හිස
රළ තරඟ හා නැළවේ
සුන්දර සිහින මැද
මනරම් මඳ සිනා මතුවේ

සුළඟ මුදු ලෙස හමනු
රළද මුදු ලෙස නැගෙනු
දුර සිට පැමිණි නැවියන්
විඩාවෙන් පෙළී ඇත
මවු බිම කරා සපැමිණ
මවු ඇකය තුරුලෙහි
අපේ නැවු විරුවන්ට
සුවසේ සැතපෙන්ට ඉඩහරිනු

යොවුන් නැවියන්ගේ හිස
රළ තරඟ හා නැළවේ
සුන්දර සිහින මැද
මනරම් මඳ සිනා මතුවේ

සුළඟමුදු ලෙස හමනු
රළද මුදු ලෙස නැගෙනු
දුර සිට පැමිණි නැවියන්
විඩාවෙන් පෙළී ඇත
මවු බිම කරා සපැමිණ
මවු ඇකය තුරුලෙහි
අපේ නැවු විරුවන්ට
සුවසේ සැතපෙන්ට ඉඩහරිනු

සුළඟ මුදු ලෙස හමනු
රළද මුදු ලෙස නැගෙනු
දුර සිට පැමිණි නැවියන්
විඩාවෙන් පෙළී ඇත

අරුණළු උදාවී
සයුරු තල රත් පැහැවූ කල
බලව, අප යුද නැවු
නැංගුරම් මුදාහල යුතුය

## කිරුලක හිමිකම

ප්‍රේමසිරි ගුණතිලක

ගොලු වූ අතීතෙක ගෙවුනු දින මග පසෙක
සිසාරා සුවද දෙන රොන් සෙවු බමර සිත

නැවතිනද මලක් ලංග පුස්ප නම කුසුම ලද
සුවද දුන් රුව අඩුව නමට ගැලපුම ලැබුව

පෙති පියලි අකුලලා නැති වරද සංගවලා
නෙත් පියන් ඉංගි කලා සෙනෙහෙ තෙත මුතු වෙලා

සක්වලට විවර දොර අගුල්ලා අහුරලා
කාන්තියෙ මිනි රස්මි විමනෙ විය විසිරිලා

සෙව්වන්දින්ගේ පහසින් ඇසුරින්
බන්දු සිතක නැත සිරිමත දැනිලා
පැලදු කිරුල නුබ යසෝදරාවට
හිමිකම් දි නැත තව විසාකාවකට

පිලුනු රසක ගුන නැත මට දැනිලා
නුබ හා වලදන පුරුදු බොජුන් වල
ඒනමුත් කියන්නෙ හැර දා යන්නද
නොකියා බෙදන්නෙ යවන පලාමද

## පදාර්ථයේ නිවන් දැක්ම

පී.එම්.පතිරණ

පදාර්ථයෙ මූළිකම
ඒකකය, * බෙදිය හැකිනම් තවත්
එඬ තවත් ඉනිඬක්බිති
පදාර්ථය විය නොහේ
බිඳහල බැවින් ...
නොසොයන් එඬවිට..
ස්කන්ධයත්,
පරිමාවත්...
ශූන්‍යය හෝ නොවේ
අවම වශයෙන්
හුදෙක් එය නොපවතී
අඩුම ගණනේ
කලූ කුහරයකවත්.

## සබඳ බට පදුර

ජයන්ත රත්නසිරි ගලප්පත්තිගේ

බිඟුන් රොන් නොසොයන
පෙති පියුම් නොපිපෙන
සබඳ බට පඳුරේ
මියුරු බට නලා හඬ
හැංගිලා

නදී තෙර ඉවුරේ
මඳ සුළඟ හා මුසුවී
ඇයි කියන් - ඇයි කියන්
නුඹ නිහඬවමැ ඉන්නේ
නුඹ නිසසළවැ ඉන්නේ

ළඟ වයන්නේ කව්රුෑ
ළඟ අසන්නේ කව්රුෑ
එක් සිත් ගිම් නිවන
මුදු හඬක් හැංගිලා

සබඳ බට පඳුරේ
මියුරු බට නලා හඬ
හැංගිලා

## නත්තල් මිහිර

එම්.සී.බෙනට් වික්‍රමරත්න

හෙල මුදුනක හිඳ ලොව වෙත දෙනෙත් හෙ ලා
කළ කිතු දෙසුම අදමිටු දන ඉවත හ ලා
නිලතල බලය ඉසිකෝ මානෙන් පිරි ලා
කුලමල ධනය මෙදියන අද දහම වෙ ලා

සතුදෙය දුගී හැම අතරේ බෙදා ගෙ න
මිතුරන් ලෙස අගයන්නට සතුරු ද න
කිතු සමිඳුගේ දෙසුමෙන් මෙත් වඩා ගෙ න
පතුරමු මිහිරි සාමය නත්තල් මෙදි න

දෙව් වරමින් මරිවම් කුස පිළිසිදු න
ලොව්තුරු රජුන් පුතු මෙන් දුන් රැකවර න
මව්පිය වරුනි සුදු පවුලේ බැතිය ගෙ න
සව්දිය පුරමු එක්වී නත්තල් මෙදි න

